13 වන පිටුවෙන් (අදිසි )

0000000

සතියේ දවසක් වුව ද මාළිගාව අවට සෙනග අඩු නැත. වාහනය නවතන්නට තැනක් සොයා ගන්නට ද සුනන්දට සෑහෙන වෙහෙසක් ගන්නට සිදු විය.

"මිනිස්සු අතේ සල්ලි නැහැයි කිව්වට කඩවල් වල සෙනග නම් අඩු වෙන්නෙ හැහැ.." සුනන්ද කියයි.

"නුවර එන්න එන්නම පුංචි වෙනවා නේද..?" වින්ධ්‍යා සිනාසෙයි. ඇයට නෙලුම් මල් මිලට ගන්නට අවශ්‍යව ඇත. මල් වෙළෙන්දන් ඉදිරියේ පිරී ඇති සෙනඟ අතරට ගැවසෙන්නට සිතේ ඇතිවන ආශාව අති මහත් ය. කොළඹ නිවසේ හුදකලාව විසින් ඇති කරනු ලැබ තිබුණ මූසල හැඟීම් සියල්ල මේ පරිසරය තුළ නැසී යාම පිළිබඳව විස්මයක් නැත.

"නුවර විතරක් නෙවෙයි.. ලෝකෙම පුංචි වෙනවා.." සුනන්ද කියයි.

වින්ධ්‍යා රතු නෙලුම් මල් කීපයක් සහ නිල් මානෙල් මලක් මිලට ගනු සුනන්ද ඈත සිට බලා සිටියි. ඈ නිල් මානෙල් මල් වලට කැමැති බව ඔහු දනියි. සුදු වාම් ඇඳුම ඇගේ රුව වඩාත් ඔප් නංවා ඇතැයි ඔහුට සිතෙයි. ආපසු හැරී බලන වින්ධ්‍යාට සුනන්ද තමා දෙස බලා සිටිනු පෙනෙයි. ඈ ඔහු දෙස රවා බලන්නේ කෝපයෙන් නොවේ.

මහා සෙනඟක් ගැවසුන ද මේ පරිසරයේ ඇත්තේ විස්මිත නිස්කලංක බවකි. පියග ැට පෙළ නැග ඉදිරියෙන් යන වින්ධ්‍යාට වඩා වැඩියෙන් මේ පරිසරයේ ශාන්ත බව සුනන්දට දැනෙයි.

"ඇත්ත කියන්න.. අන්තිමට පන්සලකට ගිහින් බුදුන් වැන්දෙ කවද ද කියල මතක ද..?" වින්ධ්‍යා නොසිතූ වේලාවක නැවතී ඔහුගෙන් අසයි. ".. මතක නැහැ නේද..?" ඔහු නිහඬව සිටින විට ඕ නැවත අසයි. ".. අද ඔයා මේ මල පූජා කරන්න ඕනෙ.." ඕ පුබුදුවන ලද නෙලුම් මලක් ඔහු අතට දෙයි. ".. ඔයා කැමති දෙයක් ප්‍රාර්ථනා කරන්න..."

මලින් පිරී ඇති මල් ආසනයේ කෙළවරක ඔහු ඒ මල දෝතින්ම තැන්පත් කරයි. මේ අද්දැකීම අමුතු ය. මතක ඇති කාලයක මේ තරම් සැනසීමක් සැහැල්ලුවක් සිතට දැනුණ බවක් ඔහුට මතක නැත. ගාථාවක් නොකියාම ඔහු ටික වේලාවක් දෑත් එක් කර වඳියි. වින්ධ්‍යා දෙස නොබලාම අන් අයට ඉඩ දී පසු පසට වෙයි.

මල් අසුන පසු කර යන මොහොතේ ඔහු හැරී තමා පිදූ මල දෙස බලයි. ඒ රතු නෙලුම් මල අසළින්ම තැන්පත් කර ඇති නිල් මානෙල් මල ඔහු සිත තුළ ඇති කරන්නේ තේරුම් ගත නොහැකි අමුතුම හැඟීමකි.

"මෙතනට ආවට පස්සෙ ආපහු කොළඹ යන්න බැහැ කියල මට හිතෙනවා.." ආපසු එන අතර වින්ධ්‍යා කියයි. ".. මේ නුවරදි මට දැනෙන සැනසීම ඒ තරම් විසාලයි.."

ඔහු ඇයට පිලිතුරු ලෙස කිසිවක් නොකියයි. ඇගේ හැඟීම් තේරුම් ගන්නට ඔහුට හැකි ය.

"අපි පුංචි කාලෙ ඉස්කෝලෙ ආවාම කෙල්ලො ටික එකතු වෙලා කරපු වැඩ මතක් වෙනකොට තනියම හිනා යනවා.. ඔයා දන්නව ද..? අපි කඩවල් වලින් ටොෆි හොරකම් කරලත් තියෙනවා..." වින්ධ්‍යා ළදැරියක සේ සිනා සෙයි. ".. මං තමයි ලීඩර්.."

"හිතාගන්න පුලුවන්.." ඔහු කියයි. "..ඔයා කොළඹ ගියාට පස්සෙ නුවර කඩවල් දියුණු වෙලා තියෙන හැටි දැක්කම.."

සැන්දෑ අව්ව නුවර වැව් දිය මත පතිතව ඇත. වාලුකා බැම්මට වාරුවී වින්ධ්‍යා වැවේ ඈත කෙළවර දෙස බලා සිටියි. වැවට ඔබ්බෙන් කඳු බෑවුමේ ඇති වේල්ස් උද්‍යානයේ බංකුවක වාඩිවී වැව දෙස බලා සිටි කාලය ඇයට සිහිපත් වෙයි. ඒ යුගය සිහිනයකි.

දේශපාලනඥයකු ගේ බිරිය වීමේ වින්දනය මායාවක් පමණක්ය යන්න ඇයට වැටහෙයි. රණසිංහ ගේ බිරිඳ ලෙස ආරක්ෂක භටයන්ට මැදිව මාළිගාවට පැමිණ විශේෂ සැළකිලි ලබා ඇතුල් ගැබට ම ගොස් වැඳ පුදා ගත් ආකාරයේ ඇති කෘතිම බව දැන් ඇයට හොඳින් දැනෙයි. තම දෝතින්ම මලක් මිලට ගෙන සිය ගණනක් බැතිමතුන්ට මැදිවී ඔවුනගේ දහඩිය සුවඳ විඳ ගනිමින් දුක් මහන්සියෙන් අද කළ මේ වන්දනාව කොයි තරම් සුන්දර ද? ජීවිතය යනු මෙය නොවේ ද?

නොසිතූ විරූ ලෙස සිය ජීවිතය කටුක ගමනකට අවතීර්ණ වී ඇති ආකාරය සිහිපත් කරන විට ඇගේ සිත දුකින් පිරී යයි. මේ දිගටම යා හැකි හෝ දිගටම යා යුතු හෝ ගමනක් නොවේ. කෙසේ හෝ ආපසු හැරී ආ යුතු ය. ඒ සඳහා අවශ්‍ය ශක්තිය තමාට ඇතැයි ඇයට සිතෙයි.

ආපසු හැරී බලන ඇයට මඳක් ඈත සිටගෙ න බලා සිටින සුනන්ද පෙනෙයි.

"මට ආසයි වැව වටේ ටිකක් දුර ඇවිදගෙන යන්න.. කැමති නං එන්න මා එක්ක.."

ලබන කළාපයට

10 වන පිටුවෙන් (වත්මක් අර්බුදයේ )

නේද? අපේ මධ්‍යම කමිටුව අනුමත කළ පරිදි අපි මහින්ද රාජපක්ෂ මහතා සමඟ ආණ්ඩුවේ කොටස්කාරයකුවීම සඳහා කතා කළා. ඒ සඳහා නිවැරදි වැඩපිළිවෙළක් ඉදිරිපත් කළා. ආණ්ඩුව සමඟ එක්ව කටයුතුකිරීම අපි මඟ හැරියා යැයි යමෙක් කියයි නම් ඔහු බොරු කාරයෙක් විතරක් නෙවෙයි, ඔහු ජනවරමටපයින් ගහලා එක්සත් ජාතික පක්ෂ නායකයන්ට ඇමතිකම් පිරිනැමූ මහින්ද රාජපක්ෂ මහතාට එල්ලවෙන පිළිකුල සහ අප්‍රසාදයයෙන් රාජපක්ෂ මහතා ගලවා ගන්න නිවට උත්සාහයක් දරන කෙනෙක්ද වෙනවා.

ප්‍රශ්නයඃ- ඔබ කියන්නේ ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට සම්බන්ධ නොවීමට වගකිව යුත්තේ ඔබනොව මහින්ද රාජපක්ෂ මහතා ප්‍රමුඛ ආණ්ඩුව බවද?

ටිල්වින් සිල්වා සහෝදරයා ඃ- පැහැදිලිවම ඔව්. ආණ්ඩුවත්, ආණ්ඩුවේ කිලිටි අපුල්ලන අයත්සඟවන සත්‍යය තමයි ඒ. ජනතා විමුක්ති පෙරමුණ සමඟ එකතු වී වැඩපිළිවෙළකට අනුව හා ජනවරමට අනුව කටයුතු කරලා මේ රටට ලබාදිය හැකිව තිබූ ජයග්‍රහණවලට පයින් ගැහුවේ මහින්ද රාජපක්ෂ මහතායි. ඒ හේතුවෙන් ඔහුට එල්ල වන ජනතා අප්‍රසාදයෙන් ඔහු මුදවාගෙ න එය ජනතා විමුක්ති පෙරමුණ පිට පැටවීමට තමයි මේ අය උත්සාහ කරන්නේ.

එය ඉතාම වැරදි දෙයක්. මහින්ද රාජපක්ෂ මහතාට අවශ්‍ය වුණේ, ප්‍රතිපත්ති මාලාවක් මත, වැඩපිළිවෙළක් තුළ ජනතා විමුක්ති පෙරමුණ හා එක්ව කටයුතු කිරීමට නෙවෙයි. දූන් එක්සත් ජාතික පක්ෂයේ පිරිසක් අරගෙන තියෙනවා වගේ ජ.වි.පෙ. ඇමතිකම් කිහිපයකට මිලදී අරගෙන සාක්කුවේ දාගෙන ඒ හයියෙන් තමන්ට කැමති විදිහේ පාලනයක් බාධාවකින්තොරව කරගෙන යන්නයි. නමුත් ජනතා විමුක්ති පෙරමුණ එවැනි පටු අරමුණුවලට විකිණෙන පක්ෂයක් නොවන නිසා රාජපක්ෂ ජනාධිපතිතුමා ජනතා විමුක්ති පෙරමුණ අතහැර එක්සත් ජාතික පක්ෂයේ පිරිසක් හා එක්ව ආණ්ඩු කිරිමට පටන් ගත්තා. ඕකයි ඇත්ත කතාව.

ලබන කලාපයේ...........
පක්ෂයේ ගමන් මග

ගායනා පන්ති - 2009

පෙබරවාරි මස 08 වැනිද ඇරඹේ

මෙහෙයවීම –

සංගීත අධ්‍යක්ෂ
තරුපති මුණසිංහ
Bachelor of Arts (Kelaniya), Master of Arts (J'pura),
Diploma in Writer ship & Communication (J'pura)

ස්ථානය –

Thomas Town Library hall.
52 Main Street Thomastown

වේලාව -

සෑම ඉරිදාවකම උදෑසන 9.00 සිට ළමුන් සහ වැඩිහිටියන් දෙපාර්ශවයම සඳහා පන්ති පැවැත්වේ.

විමසීම්

(Mobile) 0413745366 / (home) 0359405226 (5 pm - 10 pm)

එන්න! නිවැරදිව ගයන්න ඉගෙන ගන්න!

Auslanka Study Center

No Service Fee
Free Consultation for International Students

Want to change education provider ?

Need to change the course ?

Visa sub class 572, 573

Need to select the right course to apply for PR ?

Have you completed your Diploma and want to do your Degree ?

Don't pay high course fee.

Talk to leading education consultants for
- Change of education provider
- Uni/Tafe placement
- Visa sub class 572, 573
- Select the right course to apply for PR

Mobile 0433 023 687
Telephone / Fax 9568 2557
www.auslanka.edu.lk (*Call, SMS or email*)
eranl@auslanka.edu.lk
ABN 50758298781
Scholarships are available for limited Numbers of Students *
*Condition apply